00020

ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය

අධ්‍යාපන පීඨය

අධ්‍යාපනවේදී (නාට්‍ය හා රංගකලා)උපාධි වැඩසටහන-පස්වන මට්ටම **2018/2019**

අවසාන පරීක්ෂණය - **2019**

අධ්‍යාපනයේ උපදේශනය හා මාර්ගෝපදේශය - **ESU3128/STU5328**

කාලය පැය තුනයි. **(03)**

---

දිනය - **2019.02.15** වේලාව - පෙ.ව.**09.30** - ප.ව.**12.30** දක්වා

---

**1 වන කොටසේ සියළුම ප්‍රශ්නවලට ද, 2 වන කොටසේ ඕනෑම ප්‍රශ්න තුනකට (03) ද පිළිතුරු සපයන්න.**

<u>1 වන කොටස</u>

01. වෘත්තීය මාර්ගෝපදේශය සැපයීම සඳහා ෆ්‍රෑන්ක් පාසන් විසින් හඳුන්වා දෙන ලද පාසෝනියන් ආකෘතියෙහි ප්‍රධාන අවස්ථා තුන **(03)** නම් කර එම එක් එක් අවස්ථාවෙහි දී සිදු කළ යුතු ක්‍රියාකාරකම සඳහන් කරන්න.

02. පාසල් ශිෂ්‍යයින්ගේ සමායෝගී බව සංවර්ධනය කිරීම සඳහා ගුරුවරයකු හට යොදා ගත හැකි උපාය මාර්ග පහක් **(05)** ලැයිස්තු ගත කරන්න.

03. නව යොවුන් වියෙහි පසුවන පාසල් සිසුන් හට උපදේශනයෙහි ඇති අවශ්‍යතාව කරුණු තුනක් **(03)** ඔස්සේ කෙටියෙන් පැහැදිලි කරන්න.

04. ගුරුවරයකු විසින් ශිෂ්‍යයින් හට වෘත්තීය මාර්ගෝපදේශය සැපයීමේ දී එලී ගින්ස්බර්ග්ගේ වෘත්තීන් තේරීම පිළිබඳ න්‍යාය ආශ්‍රිත දැනුම යොදා ගත හැකි ආකාරය කෙටියෙන් පැහැදිලි කරන්න.

05. උපදේශන වෘත්තිය සඳහා ආචාරධර්ම පද්ධතියක් අවශ්‍ය වන්නේ මන්ද යන්න කෙටියෙන් පැහැදිලි කරන්න.

06. උපදේශනය පිළිබඳ ප්‍රජානන චර්යාවාදී ප්‍රවේශයෙහි මූලික අදහස කෙටියෙන් විස්තර කරන්න.

07. වර්තමානයෙහි ඇතැම් පාසල් ශිෂ්‍ය ශිෂ්‍යාවෝ ජනප්‍රිය සමාජ මාධ්‍ය අනිසි ලෙස භාවිතය හේතුවෙන් විවිධ ගැටළුකාරී තත්ත්වවලට මැදි වෙති. මෙබඳු ගැටළු වැළැක්වීම සඳහා පාසල් උපදේශන සේවාව විසින් අනුගමනය කළ හැකි ක්‍රියාමාර්ග තුනක් **(03)** යෝජනා කරන්න.

08. සාමාන්‍ය පංතිකාමරය තුළ ඉගැන්වීමෙහි දී විශේෂ අවශ්‍යතා සහිත ළමුන් පිළිබඳ විශේෂ දැනුමක් ගුරුවරයකු සතු විය යුත්තේ මන්දැයි කෙටියෙන් පැහැදිලි කරන්න.

(ලකුණු 5 x 8 = 40)

## 2 වන කොටස

09. (i) උපදේශනය පිළිබඳ සංජානනික ප්‍රපංචමය ප්‍රවේශයෙහි මූලික දර්ශනය කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 04)

(ii) සංජානනික ප්‍රපංචමය ප්‍රවේශයෙහි දැක්වෙන ආකාරයට උපදේශන ක්‍රියාවලිය සාර්ථක වීම සඳහා පැවතිය යුතු තත්ත්ව දෙකක් **(02)** කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 3 x 2 = 06)

(iii) පාසල් ශිෂ්‍යයින් මුහුණ දෙන ගැටළු සඳහා උපදේශනය සැපයීමෙහි දී සංජානනික ප්‍රපංචමය ප්‍රවේශය භාවිතයෙහි ඇති යෝග්‍යතාව අගයන්න. (ලකුණු 10)

10. (i) අවම වශයෙන් උදාහරණ තුනක් **(03)** වත් දක්වමින් කායික නොහැකියා යන පදය පැහැදිලි කරන්න. (ලකුණු 04)

(ii) පංතිකාමර ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය අතරතුර ශ්‍රවණ ඌනතා සහිත ළමුන් හඳුනා ගැනීමට හැකි වන පරිදි ඔවුන් තුළින් විද්‍යාමාන වන චර්යා තුනක් **(03)** කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 2 x 3 = 06)

(iii) ශ්‍රවණ ඌනතා සහිත ළමුන්ගේ ඉගෙනුම් ක්‍රියාවලිය සුසාධ්‍ය කිරීමෙහි දී ගුරුවරයකු විසින් යොදා ගත හැකි සුවිශේෂී උපාය මාර්ග තුනක් **(03)** පැහැදිලි කරන්න. (ලකුණු 10)

11. (i) පාසල් මාර්ගෝපදේශ හා උපදේශන සේවාවක් පවත්වා ගැනීමේ දී එම සේවාවෙහි ඵලදායී බව ඉහළ නැංවීම සඳහා වෙනත් වෘත්තිකයින්ගේ සහාය ද ලබා ගත හැක. එබඳු වෘත්තීන් හතරක් **(04)** නම් කරන්න. (1 x 4 ලකුණු 04)

(ii) පාසල් මාර්ගෝපදේශ හා උපදෙශන සේවාවක් හා සම්බන්ධිත මූලික ක්‍රියාවලි තුනක් **(03)** නම් කර එම එක් එක් ක්‍රියාවලියෙහි වැදගත්කම කෙටියෙන් දක්වන්න. (ලකුණු 2 x 3 = 06)

(iii) පාසලක් තුළ මාර්ගෝපදේශ හා උපදේශන සංවිධානයක් පිහිටුවීමෙහි දී එම පාසලට මුහුණ දීමට සිදුවිය හැකි අභියෝග/ගැටළු තුනක් **(03)** කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 10)

12. (i) "සුහග හා ඉහළ හැකියා සහිත ළමුන්" යන සංකල්පය කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 04)

(ii) ගුරුවරයා විසින් සුහග හා හැකියා සහිත ළමුන් කෙරෙහි විශේෂ අවධානයක් යොමු කිරීමෙහි ඇති වැදගත්කම අවම වශයෙන් කරුණු තුනක් **(03)** දක්වමින් පහදන්න. (ලකුණු 2 x 3 = 06)

(iii) "සුහග හා ඉහළ හැකියා සහිත ශිෂ්‍යයකු/ශිෂ්‍යයින් සිටින පංතියකට ඉගැන්වීමෙහි දී ගුරුවරයකු විසින් සුවිශේෂී ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාකාරකම් හා ශිල්ප ක්‍රම භාවිතා කළ යුතුය."

එබඳු ක්‍රියාකාරකම් හා ශිල්ප ක්‍රම සඳහා උදාහරණ තුනක් **(03)** වත් දක්වමින් ඉහත ප්‍රකාශය සාකච්ඡා කරන්න. (ලකුණු 10)

13. සමාජයෙහි සිටින සෑම පුද්ගලයෙකුට ම විවිධ අවස්ථාවන් හිදී උපදේශනය අවශ්‍ය වේ.

(i) උපදේශනයෙහි ප්‍රධාන ක්ෂේත්‍ර හතරක් **(04)** නම් කර එම එක් එක් ක්ෂේත්‍රයට අදාළව උපදේශනය අවශ්‍ය විය හැකි පාසල් සමාජයෙහි විවිධ කොටස්කරුවන් දෙක **(02)** බැගින් නම් කරන්න. (ලකුණු 04)

(ii) "පාසල් පරිසරයෙහි ස්වාභාවය හා එහි සිදුවන ඇතැම් සිදුවීම් ශිෂ්‍යයින් තුළ ක්ලමථය ඇති වීමට හේතු විය හැක."

සුවිශේෂී උදාහරණ දෙකක් **(02)** දක්වමින් ඉහත ප්‍රකාශය පිළිබඳ ඔබගේ අදහස් පැහැදිලි කරන්න. (ලකුණු 06)

(iii) ගුරුවරයෙකුහට තම වෘත්තියෙහි සාර්ථක වීම සඳහා මාර්ගෝපදේශය හා උපදේශනය පිළිබඳ දැනුම උපකාර වන්නේ කෙසේද යන්න කරුණු තුනක් **(03)** ඔස්සේ සාකච්ඡා කරන්න. (ලකුණු 10)

14. (i) උපදේශන ශිල්ප ක්‍රමයක් ලෙස ආත්ම චරිත කථාවල ඇති වැදගත්කම කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 04)

(ii) උපදේශනයෙහි දී යොදා ගන්නා ආත්ම චරිත කථා වර්ග දෙක **(02)** නම් කර එම එක් එක් වර්ගය කෙටියෙන් හඳුන්වා දෙන්න. (ලකුණු 3 x 2 = 06)

(iii) ඔබ ඉහත සඳහන් කළ ආත්ම චරිත කථා වර්ග දෙක අතරින් අධ්‍යාපනික උපදේශනය සඳහා වඩා සුදුසු කුමන චරිත කථා වර්ගය ද? ඔබේ පිළිතුර සාධාරණීකරණය කරන්න. (ලකුණු 10)

හිමිකම් ඇවිරිණි.